# කැලණිය විශ්වවිද්‍යාලයේ විභාග කටයුතු පිළිබඳ නිවේදනයයි

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ විද්‍යාර්ථීන් 05 දෙනෙකුට කොවිඩ් 19 වෛරසය ආසාදනය වී ඇති බව ඊයේ (පෙබරවාරි 04 දින) තහවුරු වී ඇත. ඒ බව වාර්තා වූයේ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුත්තක් සඳහා පිටත්ව යාමට නියමිතව සිටි කණ්ඩායමකින් 20 දෙනෙකු පෙබරවාරි 01 වැනි දින අහඹු ලෙස PCR පරීක්ෂණයක් සඳහා යොමුකිරීමෙන් අනතුරුවය. එම විද්‍යාර්ථීන් අතරින් තිදෙනෙකු විශ්වවිද්‍යාලයීය නේවාසිකාගාරවල රැඳී සිටි අය වන අතර දෙදෙනෙකු බාහිර නවාතැන්වල රැඳී සිටි අය බව හඳුනා ගන්නා ලදි. ඒ අනුව අදාළ පිරිස සෞඛ්‍ය අංශ විසින් අදාළ ප්‍රතිකාර සඳහා රැගෙන යන තෙක් විශේෂ නේවාසිකාගාරයකට යොමු කර ඇති අතර එම විද්‍යාර්ථීන් හා ඔවුන්ගේ ආශ්‍රිතයන් රැඳී සිටි නේවාසිකාගාර තුනක් මේ වන විටත් නිරෝධායනයට ලක් කර තිබේ. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිතුමාගේ උපදෙස් පරිදි ආසාදිතයින්ගේ ආශ්‍රිතයන් 20 දෙනෙකුගෙන් යුක්ත පිරිසක් සඳහා රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණයක් අද දින සිදු කරන අතර හඳුනා ගත් දෙවන පෙළ ආශ්‍රිතයන් සඳහා ලබන සඳුදා දින (පෙබරවාරි 08) අදාළ පරීක්ෂණය සිදු කිරීමට නියමිතය. ආසාදනයට ලක් වූ සිසුන් ලිඛිත පරීක්ෂණ සඳහා පෙනී නොසිටි බව ද අවධාරණය කළ යුතුය.

පවත්නා තත්ත්වය සමාලෝචනය කළ උපකුලපතිතුමිය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨාධිපතිවරුන්, ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂ සහ ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමා ඇතුළු පිරිසකගේ උපදෙස් මත පෙබරවාරි මස 01 වැනි දින ආරම්භ වූ අවසන් වසර පරීක්ෂණ කටයුතු දැනට සැලසුම් කර ඇති පරිදි නිරෝධායන රෙගුලාසි යටතේ විශ්වවිද්‍යාල පරිශ්‍රයේම පැවැත්වීමටත් නිරෝධායනයට ලක් කළ නේවාසිකාගාරවල රැඳී සිටින විද්‍යාර්ථීන්ට එම නේවාසිකාගාර තුළදීම පරීක්ෂණ සඳහා පෙනී සිටීමටත් අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත. නිරෝධායනයට ලක් කර ඇති කාල සීමාව තුළ අදාළ නේවාසිකාගාර සඳහා ආහාරපාන සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ වැඩපිළිවෙලක් ද ක්‍රියාත්මක වේ. අවසන් වසර පරීක්ෂණ කටයුතු පෙබරවාරි මස 23 වැනි දිනෙන් අවසන් වීමට නියමිතය. ඒ අනුව විභාග අවසන් වන තුරු ආශ්‍රිතයින් සහ සෙසු ශිෂ්‍යයින් එකිනෙකාගෙන් වෙන් කර තැබීමට ගත යුතු සියලුම පියවර විශ්වවිද්‍යාල පරිපාලනය විසින් ගෙන ඇත. මේ අතර අද උදෑසන කැලණිය විශ්වවිද්‍යාලයේ විභාග ශාලා සහ නේවාසිකාගාර පරීක්ෂා කළ කැලණිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා (MOH) ඇතුළු කණ්ඩායම ප්‍රකාශ කළේ පවතින තත්ත්වය හමුවේ විශ්වවිද්‍යාලය මගින් මේ වන විට ගෙන ඇති පියවර ඉතා සතුටුදායක මට්ටමක පවතින බවය.